Prepared by- පී.ඊ.එම්.ආර්.ආර්.ආර්.ඒකනායක

කලාප අධ්‍යාපන කාර්යාලය - ඇඹිලිපිටිය

Department of Education,Sabaragamuwa Province/ Weekly School

### 3.7.1 අභිරූපණ රංගනය

ලෝක නාට්‍ය කලාව තුල අභිරූපණ රංගනයට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි . නළුවාගේ ආංගික හා සාත්වික අභින යොදා ගනිමින් හා වාචික අභිනය භාවිතා නොකොට මෙම රංගයන් සිදු කිරීම නිසා අභිරූපණ කලාව විශ්ව භාෂාවක් ලෙසට පිළිගැනීමට ලක් කර ඇත. වචන භාවිතා නොකර මුහුණේ හා ශරීරයේ අංග වලින් මානුෂීය හැඟීම ප්‍රේක්ෂක සමූහයා වෙත ඉදිරිපත් කිරීම මෙම රංගයේ මූලික අරමුණ වූ අතර සමාජ විකාශනයත් සමග සමාජ,ආර්ථික, දේශපාලනික මාතෘකා මූලික කරගනිමින් අභිරූපණ රංගනයන් සිදු කිරීමට ඇතමුන් උත්සහ දැරිය.

මුල් කාලයේ මෙම රංගයන් සාමාන්‍ය නිරූපණයට වඩා අතිශයෝක්තියෙන් රඟ දක්වන ලදී. පසු කාලීනව රංග ක්‍රමවේද දියුණුවීමත් සමග ස්භාවික රංගයන් දක්වා වර්ධනය විය.එහෙත් ඇතැම් රංගයන් සංකේතාත්මක වී ඇත.

පරිකල්පන ශක්තිය හා නිර්මාණ චින්තනය අභිරූපන ශිල්පියෙකුට අත්‍යාවශ්‍යය.එසේම නම්‍යශීලී හා සැහැල්ලු ශරීරය,තමාට අවනත මුහුණේ මාංශපේශීන් සාර්ථක අභිරූපන ශිල්පියෙකුගේ ලක්ෂණයන්ය.සෑම විටම අභිරූපණයේ යෙදෙන නළුවා මැවුම් කරුවෙකි.එනම් කිසියම් දෙයක් හෝ භාණ්ඩයක් භාවිතා නොකරමින් ඕනෑම ස්ථානයක තම ශරීරය පමණක් භාවිතාකරමින් සිදුවීම් මවා පෙන්වීම මෙම රංගනයේ සුවිශේෂීම ලක්ෂණය වීමය.

අභිරූපණ රංගනයටම බඅාවේණික වූ ශිල්ප ක්‍රමයන් පැවතීම නිසා,අභිරූපණ රංගන ශිල්පියා එම රංගනයන් සඳහා දීර්ඝ කාලීන අභ්‍යාසකරණයේ හා පුහුණු වීම් වල නිරත වීමද සුවිශේෂී ලක්ෂණයකි.

අභිරූපණ රංගය සඳහා නිශ්චිත රංගභූමියක් නොමැත.ඒ අනුව සමාන්‍ය වේදිකාවල පමණක් නොව ජනාකීරණ වීථි, බස් හා දුම්රියපොළවල්,තානායම්,කෝපි ශාලා,සාප්පු සංකීරණ ,බස් රථ,දුම්රිය මැදිරි වැනි සෙනඟ ගැවසෙන ඕනෑම ස්ථානයක් අභිරූපණ රංගය සඳහා භාවිතා කල හැක.

අභිරූපණයේදී නළුවාගේ ශරීරය හා මුහුණ මූලික වන නිසා සුවිශේෂී රංග වස්ත්‍ර භාවිතා නොවේ.අංගරචනය කිරීමේදීද සුදු වර්ණය මූලික වර්ණය ලෙස භාවිතා කරමින් පැතලි අංගරචනයක් සිදුකරයි.නළුවාගේ කට,ඇස් සහ ඇහි බැම මූලික වශයෙන් තීව්‍ර කර පෙන්වයි.

විශිෂ්ඨ අභිරූපණ රංගන ශිල්පීන් අතර මාෂල් මාෂු ( **Marcel Maceau** ), චාර්ලි චැප්ලින් (**Charlie Chaplin** )ලෝකයේම පිළිගත් ශිල්පීන් වන අතර ශ්‍රී ලාංකීය අභිරූපන ශිල්පීන් අතර ජයන්තා රණවක,භාණු ප්‍රසන්න,මංගල ප්‍රනාන්දු,මහේන්ද්‍ර පෙරේරා,සැනට් දික්කුඹුර,විමල් කුමාර ද කොස්තා,ප්‍රදීප් රාමවික්‍රම වැනි ශිල්පීන් නම් කල හැක.



මාෂල් මාෂු



චාර්ලි චැප්ලින්




ජයන්තා රණවක

පැවරුම්

**1.**අභිරූපණ රංගනය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

**2.**වේදිකා නාට්‍යක හා අභිරූපණ රංගනයක වෙනස පැහැදිළි කරන්න.

**3.**සරළ අභිරූපන රංගනයක් නිර්මාණය කරගන්න.